**ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, වාණිජ අත්තිකාරම් ගිණුම්, සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.2 වගුවල ඇතුළත් ආදායම් සංකේතවලට අදාළ ආදායම් ගිණුම් 01 ක්ද, බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 31 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

-----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.18 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) - ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ප්‍රසම්පාදන කටයුතු සැලැසුම් නොකිරිම/ ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.1.1 |
| | | 2. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.3 |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.1.2 |
| 128(1)(ආ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. අනුකූල නොවීම් | 2.9 |
| | | 2. කළමනාකරණ අඩුපාඩු | 2.11 |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | **1. අභ්‍යන්තර විගණනය** | 2.10 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.2<br>2.4 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව. | 1. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.5 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාරතා කරන බව. | 1. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.6 |
| | | 2. වාණිජ අත්තාරම් ගිණුම්වල හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයුම් හා සේවා ලබා ගැනීම.

#### 2.1.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහන සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.1.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.

2017 වර්ෂයේ දර මිලදී ගැනීම සඳහා රු. 24,397,730 ක් වැයකර තිබුණු අතර 2017 ප්‍රසම්පාදනයන් සිදු නොකර 2016 වර්ෂයේ ප්‍රසම්පාදනය යටතේ මිලදී ගෙන තිබුණි.

### 2.2 වත්කම් කළමනාකරණය

බන්ධනාගාර ආයතන 05 ක් සතුව ඉඩම් හෙක්ටයාර් 13.0637 ක් වර්ෂ 3 සිට 7 ක් අතර කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. තවද පිරිවැය රු. 42, 500 ක් වූ යන් පිරිවැය රු. 217, 000 ක් වූ උපකරණ නිෂ්ක්‍රීයව පැවතුණි

**2.3** **බැදීම් හා බැරකම්**

**වාර්ෂික අය වැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම.**

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 60 ක ප්‍රතිපාදනය රු.මිලියන 62.34 කින් ඉක්මවා රු.මිලියන 2.34 ක බැරකම්වලට එළඹ තිබුණි.

**2.4** **කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 2001 , 2005 කාලය තුළදී බන්දනාගාර රුදවියන්ගේ වැටුපෙන් සියයට 10 අඩුකර ත්‍යාග අරමුදලක් ආරම්භ කර තිබුණද ඊට භාණ්ඩාගාර අනුමැතිය ගැනීමට කටයුතු කර නොතිබුණි. එම අරමුදල් ඉතිරි කිරීමේ ගිණුම් එකක් ස්ථාවර තැන්පතු ගිණුම් 02 ක් ආරම්භ කර තිබුණි. ආපසු ගැනීම් කිසිවක් නොතිබුණු මෙම ගිණුමෙහි 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පිළිවෙලින් රු.5,716,858 ක්, රු.500,000 ක් හා රු.700,000 ක් විය. මෙම මුදල් නිෂ්ක්‍රියව තැන්පත් කළ දා සිට 2018 වන තෙක් දන්වා තිබුණි. මෙම ගිණුම ආරම්භ කිරීමට භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) ත්‍රිකුණාමලය හා මඩකලපුව බන්ධනාගාර වෙනත් ස්ථානවලට ගෙන යාම සඳහා 1995 - 2016 කාලපරිච්ඡේදය තුළදී ඉඩම් හෙක්ටයාර් 9.31 ක් පවරාගෙන තිබූ අතර යෝජිත නව ඉදිකිරීම්වල 2018 ඔක්තෝබර් වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඇ) බන්ධනාගාර ආයතන 30 ක සිරකරුවන්ගේ තොරතුරු ඇතුළත් තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට 2011 වර්ෂයේ සැලසුම් කර තිබුණි. ඒ සඳහා 2017 වර්ෂය වන විට රුපියල් මිලියන 70.49 ක් වැය කර තිබුණි. වැලිකඩ බන්ධනාගාරයේ පරීක්ෂණ මට්ටම ආරම්භ කර වර්ෂ 5 ක් ගත වී තිබුණද තොරතුරු පද්ධතියේ සැලැසුම් කර අරමුණ කරා ලගා වීමට නොහැකි වී තිබුණි. 2016 මිලදීගත් 23 ක් හා ඊට අවශ්‍ය උපාංග ආයතන 29 ක් වෙත 2017 පෙබරවාරි 14 දින බෙදා දුන්නද ජලගත කිරීම 2017 දෙසැම්බර් 31 දක්වාම සිදුකර නොතිබුණි. මේ අනුව ඒවා භාවිතා නොවන බවද නිරීක්ෂණය විය.

**2.5** **කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2016 | පුනරාවර්තන | 5,319 | 4,792 | 527 | 10 |
| | මූලධන | 3,240 | 2,106 | 1,134 | 35 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **එකතුව** | **8,559** | **6,898** | **1,661** | **19** |
| 2017 | පුනරාවර්තන | 5,275 | 4,762 | 513 | 10 |
| | මූලධන | 1,265 | 1,078 | 187 | 15 |
| | **එකතුව** | **6,540** | **5,840** | **700** | **11** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීමට අපේක්ෂිත කාර්යමණ්ඩල සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුව අවශ්‍ය ප්‍රතිපාදනය සලසා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට අපේක්ෂිත පරිදි කාර්යමණ්ඩල බඳවා ගැනීමට නොහැකිවීම නිසා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 545 ක් හෙවත් සියයට 16 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

අ) විසර්ජන ගිණුම
-----------------

වැය විෂයයන් 03 ක් සඳහා එකතුව රු.මිලියන 8 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 34 සිට සියයට 55 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 23201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| 180 | 154 | 135 | 135.8 | 400 | 291 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම.
--------------------------------------------

විගණනයට ඉදිරිපත් කළ සැසැඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව රු.6,250,001 ක් වූ අතර එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත් එම හිඟහිටි ණය ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) විධිවිධානවලට පටහැනිව ණය නිකුත් කිරීම

---

2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ණය ගෙවීමේ උපරිම හිමිකම වූ රු.250,000 ක් ඉක්මවා බදුල්ල බන්ධනාගාරයේ නිලධාරීන් 03 දෙනෙකු සඳහා ආපදා ණය ලබා දී තිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.816,017 ක් විය.

(ඇ) ණය මුදල් අයකර ගැනීමේ දී බන්ධනාගාර නිලධාරීන් 84 දෙනෙකුගෙන් රු.210,527 ක මුදලක් වැඩිපුර අයකර ගෙන තිබූ නමුත් එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.7 වාණිජ අත්තිකාරම් ගිණුම

විෂය අංක 7000/0/0/0232/0002 දරන වාණිජ අත්තිකාරම් කාර්ය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව එහි මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල | | | |
|---|---|---|---|---|
| | 2017 | | 2016 | |
| | ලාභය කල්පිත ගාස්තු රහිතව | පාඩුව කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | පාඩුව කල්පිත ගාස්තු සහිතව |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුම | 60.425 | 25.025 | 63.07 | 10.34 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා වූ වාණිජ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කළ අතර, ඊට පෙර වර්ෂ සම්බන්ධයෙන්ද තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට මුළු ණයගැති ශේෂය වූ රු.49,368,410 ක් තුළ රාජ්‍ය අංශයට අදාළව රු.49,332,791 ක හා පෞද්ගලික අංශයට අදාළව රු.35,618 ක ණයගැති ශේෂ පැවතුණි වර්ෂ 10 කට වඩා වැඩි කාලයක් සිට පැවත එන රු.8,952,285 ක්ද, වර්ෂ 5 කට වැඩි 10 කට අඩු රු.4,123,969 ක්ද හා වර්ෂයකට වැඩි හා වර්ෂ 5 කට අඩු රු.23,672,777 ක ද ණය ශේෂ පැවති අතර ණය අයකර ගැනීමට කමිටුවක් පත්කර තිබුණද ණය අයකර ගැනීමට අපොහොසත් වී තිබේ.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී බන්ධනාගාර ආයතන 10 ක වැඩ අංශ 16 ක කිසිදු නිෂ්පාදනයක් සිදු කර නොතිබුණි

## 2.8 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 08 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 200.5 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් 03 කට අදාල වර්ෂ 2 ක් ඉක්ම වූ රු.215,634 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සිර වේතන හා පුද්ගලික මුදල් ගිණුමෙහි 2017 දෙසැම්බර් 31 දිනට රු.4,282,317 ක ශේෂයක් පැවතුණු අතර එම මුදල් සිරකරුවන්ගේ පෞද්ගලික බැංකු ගිණුම්වලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. 9 අනුකූල නොවීම.

### 2.9.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 05 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 215(1) | කුරුවිට බන්ධනාගාරයේ බස් රථ දෙකක් අළුත්වැඩියාව නිම කිරීමට පෙර යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ පරීක්ෂා කිරීමකින් හා වගකීම් සහතික ලබා ගැනීමකින් තොරව රු.491,890 ක් ගෙවා තිබුණි. |

## 2.10 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක ඩීඑම්ජ්/2009(i) පරිදි අත්තිකාරම් ගිණුමේ ගනුදෙනු පිළිබඳව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි

## 2.11 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 1,817 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 165 | 82 | 83 |
| (ii) | තෘතියික මට්ටම | 134 | 49 | 85 |
| (iii) | ද්විතියික මට්ටම | 7,154 | 5,532 | 1,622 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 419 | 275 | 144 |
| | **එකතුව** | **7,872** | **5,938** | **1934** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තනතුරු 12 ක් සඳහා බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගෙන නොතිබීමෙන් පුරප්පාඩු 112 ක් පිරවීමට නොහැකිව තිබූ අතර සුදුසුකම්ලත් නිලධාරීන් නොමැති වීම මත විශේෂ ශ්‍රේණිය ඇතුළු අධිකාරි තනතුරු 17 ක්, ප්‍රධාන ජේලර් හා I පෙළ ජේලර් කාන්තා තනතුරු 07 ක් ඇතුළු පුරප්පාඩු 30 ක් පිරවීමට නොහැකිව තිබුණි.

(ආ) ඉහත පුරප්පාඩු හේතුවෙන් තල්දෙන බන්ධනාගාරයෙහි කෘෂිකාර්මික, වඩු හා පැස්සුම් අංශවල කටයුතු අඩාල වීමත්, පල්ලෙකැලේ බන්ධනාගාරයේ ආරක්ෂිත වැටක් නොවූ අතර මුරපොළවල් 28 ක් ස්ථාපිත කර තිබුණද , ඊට අවශ්‍ය සේවකයන් නොවීම, තංගල්ල බන්ධනාගාරයේ උසාවියට රැඳවියන් රැගෙන යාමේදී ගැටලුකාරී තත්වයන් ඇති වීමත්, බදුල්ල, කුරුවිට කාර්යාල වල ආයතනික කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාමට නොහැකි වීමත් සිදුවී තිබුණි.